# 3 ශ්‍රේණිය සිංහල

# පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු

# 11 ඒකකය - 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1



# රජතුමාගේ ඔටුන්න

ගෙදර ගිය යාළුවෝ සවස ආයෙත් පාසලට ආවා.
ඒ, වාර අවසානයේ විවිධ ප්‍රසංගයට නාට්‍ය පුහුණු වෙන්න.

විවිධ ප්‍රසංගයෙන් පස්සේ නිවාඩු කාලේ.

"අපේ තාත්තා කිවුවා මේ ගමන කැලෑවක ඇවිදින්න යමුයි කියලා. මම කවදාවත් කැලෑවකට ගිහින් නැහැ. මම හරි ආසාවෙන් බලන් ඉන්නේ ඒ දවස එනකල්." පියුමි කිවුවා.

"අපි නම් ගමේ යනවා." රුවින්දි කිවුවා.

"ගමේ යන එකත් හොඳයි. ඒත් ඉතිං රටේ තොටේත් ටිකක් ඇවිදින්න ඕනෑ.
නැත්නම් ඉතිං **ළිඳේ ඉන්න ගෙම්බා** වගේ තමයි."
ගුරුතුමා ද කතාවට එකතු වුණා.
රජතුමාට රඟපාන පසිඳු තවම ඇවිත් නැහැ.

යාළුවෝ කසු කුසු ගෑවා.
"ළමයි දැන් අපි නාට්‍ය පුහුණුව පටන් ගනිමු." ගුරුතුමා කිවුවා.

"එතකොට රජතුමා..." පියුමි ඇසුවා.


"පසිඳු එනකල් මම රජ වෙන්නම්."
මනුක එක අතක් ඉනට ගසා අනෙක් අත ඉහළට ඔසවා
තාල තබා වටයක් කැරකුණා.

යාළුවෝ සිනා සුණා.

"ඇයි හිනා වෙන්නේ. මට රජ වෙන්න බැරි ද?
පසිඳු ආවා ම මම රජකම භාර දෙනවා."
මනුක කිවුවේ දැත් දිගු කොට හිස නමමින්.
යාළුවෝ හොඳට ම සිනා සුණා.


"සිතුම්... එන්න ඉස්සරහට.
ඔයාගේ කොටස රඟපාන්න."





“පස්වාන් දහසකට බුදු වෙන්න දේවයන් වහන්ස,
මම ඔබ වහන්සේ ඉදිරියේ මුසා බස් දොඩනවා නොවෙයි.
ඒ මිනිහා **මඬේ හිටවපු ඉන්න වගෙයි.**

අඳේට කුඹුර දෙන්නම් කිවුවා මුලින් ම. ඒත් දැන් කෙළින් වචනයක්
දෙන්නේ නැහැ.
සලකා බලන්නම්... සලකා බලන්නම්... හැමදාම සලකා බලන්නම්.”



“අන්න හරි, අද සිතුම් හොඳට රඟපෑවා. ඔය වගේ ම එදාටත් රඟපාන්න ඕනෑ.” ගුරුතුමා සිතුම්ගේ හිස අත ගෑවා.

“ඔය එන්නේ පසිඳුයි තරිඳුයි හරියට **ඉදිකටුවයි නූලයි වගේ.**” සිතුම් කිවුවෙ පසිඳුයි තරිඳුයි නැටුම් කාමරයට ඇතුළු වෙනකොට මයි.

“පසිඳු කොතැන ද තරිඳුත් එතැන. තරිඳු කොතැන ද පසිඳුත් එතැන. නාට්‍යයට නැති වුණත් තරිඳු ආවෙ පසිඳු ඉන්න නිසා.” සිතුම් කියාගෙන කියාගෙන ගියා.

"වෙලාවට වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ."
ගුරුතුමා පසිඳුගෙ පිටට තට්ටුවක් දැම්මා.

"නෑ සර්... තරිඳුගෙ මාමාගේ පුතා ළඟ ඔටුන්නක් තියෙනවා කිවුවා. අපි ඒක බලන්න ගියා."

"ඉතින් මෙච්චර පරක්කු වුණේ ඇයි?"

"තරිඳු මාමලාගේ ගෙදරට එක්ක ගියේ **පරංගියා කෝට්ටේ ගියා වගේ** පාරකින්.
මේ පාරෙන් ලෙහෙසියි කිය කියා මාව ලොකු වටයක් එක්ක ගියා. එනකොට ආවෙ කෙටි පාරකින්."

"කෝ ඉතිං ඔච්චර දුර ගිහින් ගෙනා ඔටුන්න?"
මනුක ඇහුවෙ ඔටුන්නක් පෙනෙන්න නොතිබුණු නිසා.

"අම්මෝ ... මෙයාගෙ මල්ලිගෙන් ඒ ඔටුන්න ඉල්ල ගන්න එක හරි අමාරුයි. ඒක **ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වගේ** වැඩක්. හැබැයි තරිඳුගේ මාමා මට ඔටුන්නක් හදලා දෙන්න පොරොන්දු වුණා."
පසිඳු කිවුවා.

"හරි. දැන් ඔටුන්නත් හරි. රජ්ජුරුවොත් හරි. අපි නාට්‍ය පුහුණුව පටන් ගනිමු."

"මෙන්න, රජතුමනි රජකම භාර ගන්න" කියමින්
මනුක පසිඳු ඉදිරියේ දණ නමා දෑත් දිගු කළා.

යාළුවෝ ඔක්කොම එක හඬින් සිනාසුණා.
නාට්‍යය පුහුණු වීමට පටන් ගත්තා.






# රජතුමාගේ ඔටුන්න

- **අවබෝධය**

**පාඩම කියවා උත්තර ලියන්න.**

1. යාළුවෝ සවස පාසලට ආවේ ඇයි?

2. නාට්‍යයේ රජතුමාට රඟපාන්නේ කවුද?

3. ඔටුන්නක් තිබුණේ කා ළඟ ද?

4. පසිඳු ඉදිරියේ දණ නමා දෑත් දිගු කළේ කවුද?

## ක්‍රියාකාරකම 2

පහත සඳහන් ප්‍රකාශ සිදු කළේ කවුද?



1. “අපි නම් ගමේ යනවා”

_______________________________________

_______________________________________

2. “පසිඳු එනකල් මම රජ වෙන්නම්”

_______________________________________

_______________________________________

3. “ඒ මිනිහා මඩේ හිටවපු ඉන්න වගෙයි”

_______________________________________

_______________________________________

4. “වෙලාවට වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ.”


_______________________________________

_______________________________________

5. “මෙන්න රජතුමනි රජකම භාර ගන්න.”

_______________________________________

_______________________________________



## ක්‍රියාකාරකම 3



**පාඩමෙහි සඳහන් ප්‍රස්තාව පිරුළු පහක් ලියන්න.**

1

2.

3.

4.

5.

## ක්‍රියාකාරකම 4

**පහත සඳහන් අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.**

i. ස්ථිර තීරණයක නොසිටීම

_______________________________________________

_______________________________________________

ii. ඉතා දුර පාරකින් ගමනක් යාම

_______________________________________________

_______________________________________________

iii. අවට සමාජය පිළිබඳ වැටහීමක් නොමැති වීම

_______________________________________________

_______________________________________________

iv. එකට ම සිටින යාළුවන් දෙදෙනෙක්

_______________________________________________

_______________________________________________

v. ලබා ගත නොහැකි දෙයක් ඉල්ලීම

_______________________________

_______________________________

_______________________________



# පිළිතුරු



**Answer**



# 11 රජතුමාගේ ඔටුන්න

- අවබෝධය

පාඩම කියවා උත්තර ලියන්න.

1. යාළුවෝ සවස පාසලට ආවේ ඇයි?

නාට්‍ය පුහුණු වෙන්න

2. නාට්‍යයේ රජතුමාට රඟපාන්නේ කවුද?

පසිඳු

3. ඔටුන්නක් තිබුණේ කා ළඟ ද?

තරිඳුගෙ මාමාගේ පුතා ළඟ

4. පසිඳු ඉදිරියේ දණ නමා දෑත් දිගු කළේ කවුද?

මනුක

## ක්‍රියාකාරකම 2



පහත සඳහන් ප්‍රකාශ සිදු කළේ කවුද?

1. "අපි නම් ගමේ යනවා"

   රැවින්දි

2. "පසිඳු එනකල් මම රජ වෙන්නම්"

   මනුක

3. "ඒ මිනිහා මඩේ හිටවපු ඉන්න වගෙයි"

   සිතුමි

4. "වෙලාවට වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ."

   ගුරුතුමා

5. "මෙන්න රජතුමනි රජකම භාර ගන්න."

   මනුක



## ක්‍රියාකාරකම 3

පාඩමෙහි සඳහන් ප්‍රස්තාව පිරුළු පහක් ලියන්න.



1 ළිඳේ ඉන්න ගෙම්බො වගේ

2. මඩේ හිටවපු ඉන්න වගෙයි

3. ඉදිකටුවයි නූලයි වගේ

4. පරංගියා කෝට්ටේ ගියා වගේ

5. ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වගේ

**ක්‍රියාකාරකම 4**

**පහත සඳහන් අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.**

i. ස්ථිර තීරණයක නොසිටීම

මඩේ හිටවපු ඉන්න වගෙයි

ii. ඉතා දුර පාරකින් ගමනක් යාම

පරංගියා කෝට්ටේ ගියා වගේ

iii. අවට සමාජය පිළිබඳ වැටහීමක් නොමැති වීම

ළිඳේ ඉන්න ගෙම්බො වගේ

iv. එකට ම සිටින යාළුවන් දෙදෙනෙක්

ඉදිකටුවයි නූලයි වගේ

v. ලබා ගත නොහැකි දෙයක් ඉල්ලීම

ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වගේ



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ